

# පුංචි

මලිති විජේසේකර

පුංචිට මේ දවස්වල හරියට වැඩ. තියෙන වැඩ ටික කරගන්න වෙලාවක් නැහැ ! ඉදුණු අඹ කන්න ලේන්නු එනවද කියලා ඇහැ ගහගෙන ඉන්න ඕන. රං කුඹලා උළුවස්සේ ගේ හදලා ඉවරද කියලා සැරෙන් සැරේ බලන්න ඕන. කෑම කාමරේ බිත්තියේ අඳින්න ගත්තු චිත්රේ ඇඳලා ඉවර කරන්න ඕන.

"මොන්ටිසෝරි යන්න ගියාම දවසම ඉවරයි !" පුංචිට කේන්තිත් එක්ක.

"මම හරි බිසී !" පුංචි අහගෙන ඉන්න ඕන කෙනෙකුට කියනවා. අහගෙන ඉන්න නම් වැඩිය කවුරුත් නෑ තමයි. අම්ම නම් අහගෙන ඉන්නව සමහර වෙලාවට. ඒත් වෙන වැඩ කරන ගමන්. පිඟන් හෝදන ගමන්. රෙදි නවන ගමන්. "හ්ම්ම්....ම්ම්" අම්මා ඒ වෙලාවට කියනවා. ඊට වැඩිය උත්තරයක් ගන්න ඕන නම් එක්කෝ අඬන්න ඕන, එහෙම නැත්නම් එකම දේ දෙතුන් සැරයක් කියන්න ඕන කියලා පුංචි දන්නවා.

"එහෙම තමයි ලොකු අය...." පුංචි තමන්ටම කියාගන්නවා. "ටිකක් කන් ඇහෙනවා අඩුයි !"

එහෙම කිව්වට චූටි බබාලටත් කන් ඇහෙනව අඩුද කියලා පුංචිට හිතෙනවා. දැන් බලන්න චූටි නංගි බබා. එයා දවසම උඩ බලාගෙන ඉන්නවා. ඊයේ පුංචි එයා ආසම මන්තරකාරියෝ හතරදෙනාගේ කතාව චූටි නංගිට ඇහෙන්න කිව්වා තොටිල්ල ළඟටම වෙලා. පුංචිට තාම පොත කියවන්න බැහැ තමයි. ඒත් කතාවම කට පාඩම්නේ ! ඒ නිසා පිටු පෙරළ පෙරළ නංගිට ඇහෙන්න සද්දෙටම කියෙව්වා. ඒත් චූටි නංගි මොකද කළේ.... කකුල කටේ දාගෙන හිනාවෙවී හිටියා විතරයි. පුංචිට හොඳටම විස්වාසයි ඒ කතාවට හිනා යන්නේ නෑ කියලා. අර කසාය හැලියට ගෙඹි කුමාරිව දාන හරිය එහෙම... අම්මෝ බයේ බෑ ! ඒකයි පුංචිට හිතුනේ ලොකු අයට වගේම බබාලාටත් කන් ඇහෙනවා අඩුද කියලා. පුංචි ඒක අම්මාටත් කිව්වා.

"නංගා තාම චූටි බබෙක් පුංචි !" ඒක අහලා අම්මා කිව්වා. ඉතින් ඒක පුංචි නොදන්නවයැ !

"පුංචි පැටියෝ.... මේ බලන්න.... නංගා කකුල කටේ දාන හැටි... ඒ කියන්නේ එයා මුණින් පෙරලෙන්න ළඟයි කියන එක. ඔයාත් ඔහොමයි චූටි කාලේ !" අම්මා ඊළඟට කිව්වා.

ඉතින් දැන් ඒක මෙතෙනට වැඩක් නැහැනේ කියලා පුංචිට හිතුණා. ඒත් එක් අම්මාට කියන්න ගියේ නැහැ. ඒ වගේ දෙවල් කිව්වහම අම්මට දුක හිතෙනවා කියලා පුංචි දැන් දන්නවා.

"ඉතින් පුංචි ඔයානේ දැන් ලොකු අක්කා.... ඔයාට නේ අපි ඔක්කොම වැඩියම ආදරේ !" කියලා අම්මා එතකොට කොහේටවත් සම්බන්ධ නැති තව කතාවක් කියනවා. හැමෝම තමන්ට ආදෙරේ බව පුංචි කොහොමත් දන්නවා. මේ කතාකරන්න ඇවිදින්නවත් බැරි පුංචි බබෙකුට වැඩිය හැමෝම තමන්ට ආදරේ වෙන්න එපායැ ! අනික දැන් පුංචිට ලස්සනට රවුම් අඳින්නත් පුළුවන්. නානකොට ඉස්සර වගේ අඬන්නෙත් නෑ.

පුංචිගේ වැඩ රාජකාරී ටික ඔක්කොම කරන්නේ ඉස්තෝප්පුවේ ඉඳන්. එතන තියෙනවා තාත්තා පුංචිට ගෙනත් දුන්නු පැත්තක් හිස් කඩදාසි ටික. චූටි නැන්දා ගෙනත් දුන්නු පැස්ටල් පෙට්ටියත් තියෙනවා. එකේ රතුපාට කූර විතරයි අඩු. ගිය සතියේ වැස්ස වෙලාවේ පුංචි, තාත්තාට කියලා කඩදාසි බෝට්ටු හදවා ගත්තා. ඒවා කාණුවේ පා කරද්දි නිකමට වගේ රතු පැස්ටල් කූරත් එකකට දැම්මා. පුංචි හිතුවේ වත් නැති විදියට ඒ බෝට්ටුව අනිත් ඔක්කොම පහුකරගෙන ඈතටම ගියා. වැස්ස පෑව්වට පස්සේ පුංචි හැමතැනම ගිහින් ඒ බෝට්ටුව හෙව්වා. ඒත් හොයාගන්න බැරි වුණා. අම්මට කිව්වා නම් බැනුම් අහන්නත් වෙනවා. ඒ නිසා පුංචි කාටවත් කිව්වෙත් නෑ. ඇඬුවෙත් නෑ. රතු පාට විතරයැ පාටකට තියෙන්නෙ ! දැන් පුංචි රතු පාට නැතිව චිත්ර අඳිනවා ! පුංචි මේ දවස්වල ගොඩක් චිත්ර අඳින්නේ ආච්චි අම්මගේ කාමරේ ගහන්න. ලබන සතියේ ආච්චි අම්මා නවතින්න එන්න ඉන්නේ කියලා අම්මා පුංචිට කිව්වා. පුංචි කැමතියි ආච්චි අම්මාට. පුංචි කියන ඒවා හදිස්සි කරන්නේ නැතිව අහගෙන ඉන්න නිසා. පුංචිට පොල් කොළ නවලා පත්තෑයෝ හදලා දෙන නිසා. පුංචි අහලාවත් නැති කවි කියලා දෙන නිසා. කලින් සැරේ ආච්චි අම්මා කියලා දුන්නු කවි එහෙන් මෙහෙන් තාම මතකයි.

"සීලිමත් මගේ සකි
යාපත් ලමේකි..."

පුංචි ලස්සන රවුමක් ඇඳලා පාට කරන ගමන් හයියෙන් කිව්වා. පුංචි ගේ ඇගේ ගැවෙන්න නොගෑවෙන්න බිම හාන්සි වෙලා ඉන්න බින්දු පුංචිගේ කටහඬට නින්දෙන්ම වලිගෙ වැනුවා.

පුංචි කඩදාසිය පැත්තකින් තියලා බින්දුගේ පැත්තට හැරුණා. ඊළඟට උගේ ඇගේ සුදු හරිය නිල්පාට ගාන්න පටන් ගත්තා. "මෙයා දවල්ටත් නිදි !" පුංචිට හිතුණා. "මට මෙතන ඉවර කරගන්න බැරි තරම් වැඩ !"




# Kids get in FREE on Day 3 of Vodafone Test matches

As the cricket buzz continues in Australiafor the Vodafone Test Series, families are the biggest winners with Cricket Australia allowing children under 16 FREE entry into the Tests on Day 3 as part of Toyota Family Day. When children are accompanied by an adult with a valid match day ticket on Day 3 they will be admitted into the Fifth Vodafone Test free of charge*.

Details of the Australia vs Sri Lanka Test matches are as follows:

**First Test**
Date: Friday 14 – Tuesday 18 December
Location:Blundstone Arena
Address: 15 Derwent Street, Bellrive TAS 7018

**Second Test**
Date: Wednesday 26 – Sunday 30 December
Location: Melbourne Cricket Ground
Address:Brunton Avenue, East Melbourne VIC 3002

**Third Test**
Date: Thursday 3 – Monday 7 January
Location: Sydney Cricket Ground
Address: Driver Avenue: Moore Park NSW 2021

Families can also enjoy an array of FREE entertainment outside each of the Test venuesin "The Outfield"; a designated family friendly zone supported by Cricket Australia's corporate partners.

On offer at "The Outfield" is a series of FREE family friendly activities including free face painting, cricket based skill testers, balloon artists, player signing sessions and plenty of giveaways.

Tickets are still available for purchase to the Vodafone Test Matches and patrons are encouraged to book early and pre-purchase to avoid potential queues at venues. For more information, please go to www.cricket.com.au.

*This offer is subject to availability. Tickets (full priced adult and free child) may have to be purchased in the same transaction to verify availability (if any). Contact your ticket agent in your state for further information. Not available in conjunction with any other offer.





## ලෝක ටෙස්ට් ඉතිහාසයේ වැඩිම ද්විත්ව ශතක ගත් ක්‍රිඩකයන්

| | පරාසය | තරඟ | ද්විත්ව ශතක |
|---|---|---|---|
| DG Bradman (Aus) | 1928-1948 | 94 | 12 |
| BC Lara (ICC/WI) | 1990-2006 | 131 | 9 |
| KC Sangakkara (SL) | 2000-2012 | 113* | 8 |